Ministry of Labour and Labour Relations

NIOSH
National Institute of Occupational Safety and Health • Sri Lanka

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

# தேசிய தொழில்சார் பாதுகாப்பு மற்றும் சுகாதார நிறுவகம்

# National Institute of Occupational Safety & Health




## වාර්ෂික වාර්තාව
## ஆண்டறிக்கை
## Annual Report

2012

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය தொழில் உறவுகள் அமைச்சர் Ministry of Labour and Labour Relations

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

# වාර්ෂික වාර්තාව 2012

NIOSH

National Institute of Occupational Safety and Health • Sri Lanka

# පටුන


**01 කොටස** **පිටුව**

- ❖ දැක්ම හා මෙහෙවර 1
- ❖ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ පණිවිඩය 2
- ❖ ලේකම්තුමාගේ පණිවිඩය 3
- ❖ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය 4

**02 කොටස**
**ඉලක්ක හා ප්‍රගතීන්** 5

ප්‍රගතින්

- ❖ පුහුණු පාඨමාලා 6
  - වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 6
  - වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම 6
  - වැවිලි ක්ෂේත්‍රය සඳහා වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ උසස් පාඨමාලාව 7
- ❖ වැඩබිම් අධ්‍යයනය කිරීම මගින් පාරිසරික මිණුම් සේවාවන් ලබා දීම 8
- ❖ වෘත්තිකයන්ගේ සෞඛ්‍ය පිළිබඳ ජීව විද්‍යාත්මක මිණුම් ලබා දීම. (ආයතන සඳහා වෛද්‍ය පර්යේෂණ ලබාදීම) 8
- ❖ දැණුවත් කිරීමේ වැඩසටහන්
  - වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ දැණුම විවිධ ආයතන සඳහා ලබා දීම. 9

**03 කොටස**
ක්‍රියාකාරකම්

- ❖ වෘත්තිය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳ පොදු ජනතාව සහ වෘත්තිය පුහුණුකරුවන් දැනුවත් කිරීම හා සෞඛ්‍ය සායන පැවැත්වීම-01 10
- ❖ වෘත්තිය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ප්‍රතිලාභ පිළිබඳ පොදු ජනතාව සහ වෘත්තිය පුහුණුකරුවන් දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම 11
- ❖ ශ්‍රී ලංකාව තුළ වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ත්‍රෛපාර්ෂික සැපයුම්කරණ වැඩමුළු පැවැත්වීම 12
- ❖ ජාත්‍යන්තර කම්කරු සංවිධානය මූල්‍ය අනුග්‍රහය දැක් වූ GREEN JOBS ව්‍යාපෘතියේ දැනුම බෙදා ගැනීමේ වැඩමුළුවක් පැවැත්වීම 12
- ❖ වෘත්තිය පුහුණු උපදේශකවරුන් සඳහා වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්බන්ධව සිංහල හා දමිළ මාධ්‍යයෙන් දින 03 බැගින් වැඩමුළු 2 ක් පැවැත්වීම 13

❖ "වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය තුලින් හරිත ලොවක් කරා" යන තේමාව යටතේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය පැවැත්වීම. 14

- 2012/10/05 වන දින ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය වෙනුවෙන් මාධ්‍ය හමුවක් පැවැත්වීම 14
- ෆින්ලේස් වැඩබිමෙහි සෞඛ්‍ය පිළිබඳව සේව්‍ය සේවකයන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම 15
- ICTAD ආයතනය හා ඒකාබද්ධව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවකයන් හට වැඩමුළුවක් පැවැත්වීම 15
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතියේ ප්‍රධාන සමුළුව 16
- වැවිලි ක්ෂේත්‍රයේ නියුතු වූවන් සඳහා සහතික ප්‍රධානෝත්සවය පැවැත්වීම 17

❖ Greater Colombo Waste Water Management Project 18

❖ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යයනය සඳහා වූ පුස්තකාලය 19

## 04 කොටස

❖ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය 20

❖ මූල්‍ය විශ්ලේෂණය 21

❖ ශේෂ පත්‍රය 22

❖ ආදායම් ප්‍රකාශය 23

❖ ගිණුම්වලට අදාළ සටහන් 24

❖ විගණකාධිපති වාර්තාව 26

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 2005 අප්‍රේල් මස 28 වන දින පිහිටුවන ලදි. මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුලින් වෘත්තිය අනතුරු හා වෘත්තිය රෝග වැලකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් පිළිපැදීම තුලින් යහපත් වැඩ පරිසර තත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබා දීමට අප ආයතනය නිරතුරුවම කැපවී සිටිමුය. මෙවැනි පුහුණුවක් තුලින් ප්‍රතිලාභ ලබා ගත හැකි සේවක, සේව්‍යය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනය හා පුහුණුව අප ආයතනය මගින් ලබාදෙනු ලබයි.

### *ආයතනික දැක්ම*

*සැමට වෘත්තීය සුරක්ෂිතතාව, සෞඛ්‍ය, හා සුභසාධනය ලබාදීම.*

### *මෙහෙවර*

*සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා සියළු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුලින් ත්‍රෛයිපාර්ශවීය කොටස් කරුවන් සවිබල ගැන්වීම.*

## කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය
## ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ පණිවිඩය.



කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ පවත්නා අයවැය කාරක සහා අවස්ථා විවාදයේදී ඔබ අතට පත් කෙරෙන මාගේ අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය විසින් ශ්‍රී ලංකා සේව්‍ය, සේවක පක්ෂ වෙත ඉටුකරන ලද සේවාවන් හා එහි ප්‍රගතිය දැක්වෙන මෙම වාර්තාව සඳහා කම්කරු විෂයභාර අමාත්‍යවරයා ලෙස පණිවිඩය නිකුත් කරන්නට ලැබීම මා භාග්‍යයක් ලෙස සලකමි.

වඩාත් ඵලදායී සේවාවක් උදෙසා රාජ්‍ය, පෞද්ගලික හා කුඩා කර්මාන්ත අංශවල ගුණාත්මක බව වර්ධනය කිරීමට මෙම ආයතනය මගින් විශාල සේවාවක් ඉටු කරනු ලබයි. මෙහිදී රැකියාවෙහි යෙදෙන ස්ථානයේ පරිසරය හා එම ශ්‍රමිකයන්ගේ රැකියාවෙහි ස්වභාවය අනුව ඔවුන්හට ඇතිවිය හැකි රෝගී තත්වයන් මැඩලීමට නිවැරදි සුරක්ෂිත ක්‍රම හා උපදෙස් ලබාදීමත් අවදානම් තත්වයන් මුදාහැර නිවැරදි ක්‍රම උපක්‍රම යොදා ගනිමින් සාර්ථක ලෙස වැඩ රාජකාරීන්හි නිරත කරවීමෙන් ඔවුන්ගේ රැකියාවේ ගුණාත්මක භාවයෙහි වර්ධනය ඇතිකර  සේවක සේව්‍ය හා රජය අතර පවත්නා ත්‍රෛපාර්ෂවීය සම්බන්ධතා තහවුරු කරමින් නීරෝගී ශ්‍රම බලකායක් ඇති කිරීම මාගේ මූලික ප්‍රයත්නය වේ.
ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට නීරෝගී ශ්‍රම බලකායක දායකත්වයෙහි අවශ්‍යතාවය මනාව අවබෝධ කරගනිමින් මාගේ අමාත්‍යාංශය යටතේ පවතින ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය නිවැරදි ඉලක්ක කරා යොමු කිරීම මාගේ අභිප්‍රාය වේ.

මෙවැනි ප්‍රයත්නයක් ඔස්සේ මහින්ද චින්තන ඉදිරි දැක්ම යථාර්තයක් බවට පත්කරමින් අප ශ්‍රමික ජනතාවගේ සමාජීය  සුරක්ෂිතතාවය හා ආරක්ෂණය වඩාත් පුළුල් කිරීමටද, ජාත්‍යන්තර ශ්‍රම ප්‍රමිතීන් බලාත්මක කිරීම මගින් හා නීති සංශෝධනය මගින් වැඩකරන ජනතාවගේ අයිතීන් සුරක්ෂිත කරලීමටද, මේ සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහායද ලබා ගනිමින් වඩා සුරක්ෂිත වැඩ පරිසරයක් බිහි කිරීමටද මා දැරූ ප්‍රයත්නය සාක්ෂාත් කරගත හැකිවීම සතුටට කරුණකි.

වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය නගා සිටුවීම සඳහා මෙම ආයතනය මගින් පවත්වන විවිධ පුහුණු පාඨමාලා මගින්ද ශ්‍රමිකයන්ගේ සේවයට සුදුසු සේවක පරිසරයේ පවත්නා ආපදා හා අවදානම් තත්ත්වයන් නිරීක්ෂණය කර අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුගත වීම සඳහා අවශ්‍ය පාරිසරික මිණුම් ලබා ගැනීම සහ සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර රැකියාවට සුදුසු බව තහවුරු කිරීම මෙම ආයතනය මගින් සිදුකරන කාර්යභාරයන් වේ.

මෙම සියළුම ප්‍රයත්නයන් සාර්ථක කර ගැනීමට කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කරලීමට මූලිකත්වය සැපයූ අමාත්‍යාංශය සහ ආයතනයේ කාර්යමණ්ඩලයටද මෙහිදී මම කෘතඥ වෙමි.
මෙම කාර්යයන්හි දී මා හා එක් වූ ත්‍රෛපාර්ෂවීය කොටස්කරුවන් වූ සේව්‍ය, සේවක නියෝජිතයන්ටද, රාජ්‍ය ආයතන, අන්තර් ජාතික කම්කරු සංවිධානය හා රාජ්‍ය නොවන සංවිධානවලටත්, මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීමට සියලු දිරිගැන්වීම් හා ශක්තිය ලබාදුන් මාගේ සහෝදර මැති ඇමතිවරුන්ටද මාගේ ස්තුතිය පුදකරනු කැමැත්තෙමි.

එලෙසම මෙම සියලුම කාර්යයන් මනා ලෙස පෙළ ගැන්වීමටද, සාර්ථකව ඉටු කිරීමටද මා හට නිසි නායකත්වය හා මග පෙන්වීම ලබා දෙන්නා වූ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටද මාගේ කෘතඥතාව පිළිගැන්වීමට මෙය අවස්ථාවක් කරගනිමි.

**ගාමිණී ලොකුගේ**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය

## කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ ලේකම්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ සභාපති තුමාගේ පණිවිඩය



2013 වර්ෂයේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ අයවැය පිළිබඳ කාරක සභා අවස්ථා විවාදයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලද මෙම අමාත්‍යාංශය හා ඒ යටතට අයත් වූ ආයතන 2012 වර්ෂයේ දී ලබාගත් ප්‍රගතිය පිළිබඳ වාර්තා මෙම ප්‍රකාශනය මගින් ඔබ අතට පත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් ලෙස සලකමි.

පසුගිය වර්ෂය තුළදී කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන විසින් ආර්ථික වර්ධනය සඳහා ප්‍රබල දායකත්වයක් සපයන වැඩකරන ජනතාවට සහ සියලු ප්‍රජාවන් වෙනුවෙන් ඉටුකළ මෙහෙවර අතිවිශිෂ්ඨය.

මේ අතරින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ඉතා කෙටිකලක් තුළදී ලබා ඇති භෞතික ප්‍රගතිය මෙන්ම මූල්‍යමය ප්‍රගතියද අතිවිශිෂ්ඨය. මෙම ආයතනය නීරෝගී සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් බිහිකර ගැනීමට සහ ආයතනය තුළ යහපත් වැඩ පරිසර තත්වයක් ඇතිකරලීමේ අරමුණින් යුක්තව පසුගිය වසරේදී කැපවීමෙන් ක්‍රියාකර තිබේ. සියලු ආකාරයේ වෘත්තිය අනතුරු වැළැක්වීමට අවශ්‍ය අධ්‍යාපන පුහුණුව හා දැනුවත් කිරීම වැනි කාර්යයන් තුළින් නව වෘත්තීය සුරක්ෂිතතා සංස්කෘතියක් බිහිකිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය ඉටුකළ මෙහෙවර ප්‍රසංසනීයයයි. මෙම සියලු කාර්යයන් තුළින් රටේ ඵලදායිතාවය වර්ධනය කිරීමේ කර්තව්‍යයට දායකත්වයක් සපයා තිබේ.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍යවන නායකත්වය නිවැරදි මාර්ගෝපදේශකත්වය සහ අනුග්‍රහය ලබාදුන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිඳුන්ටත් මාගේ ගෞරව පූර්වක කෘතඥතාවය ප්‍රකාශ කර සිටිමි.

එමෙන්ම මෙම කාර්යය සාධනය අත්කර ගැනීමට කැපවීමෙන් සහ සහයෝගයෙන් කටයුතු කළ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඇතුළු සියලු ආයතන ප්‍රධානීන්ටත් එම ආයතනවල සියලු කාර්ය මණ්ඩල නිලධාරීන්ටත් මාගේ ස්තූතිය පුදකර සිටිමි.

ඒවාගේම ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අභිවෘද්ධිය උදෙසා අනුපමේය මෙහෙයක් ඉටුකළ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුදකර සිටිමි.

**ඩබ්ලිව්.ජේ.එල්.යූ.විජයවීර**
ලේකම්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
සභාපති, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය



2013 වර්ෂය සඳහා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ අයවැය පිළිබඳ කාරක සභා විවාදයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලද ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ 2012 වර්ෂයේ දී ලැබූ ප්‍රගතිය පිළිබඳ විස්තර මෙම ප්‍රකාශය මගින් ඔබ අතට පත්කරන්නේ ඉමහත් සතුටිනි.

සමාලෝචන කාලය තුළ අප ආයතනය විසින් දිවයින පුරා සිටින වැඩකරන ජනතාවට හා හාම්පුතුන් සඳහා රැකියාව ජීවිතයට තර්ජනයක් වන අවස්ථා පෙන්වා දෙමින් රැකියාව නිසා සිදුවන අනතුරු හා ලෙඩරෝග මර්ධනය කරමින් නීරෝගී ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම උදෙසා අප ආයතනය කරන ලද සේවාවන් අති මහත්ය.

ඒ අනුව ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් නීරෝගී ශ්‍රම බලකායක් බිහි කිරීම උදෙසා වැඩපරිසරයේ ආපදා තත්වයන් හඳුනාගෙන ඒ සඳහා අනුකූල මිණුම් ලබාගැනීම මගින් වැඩකරන පරිසරයේ ඇති විවිධ ආපදා තත්ත්වයන්ට නිරාවරණයන් අවම කර ගැනීමට ක්‍රියා කිරීම අපගේ අභිප්‍රායන් අතර මූලික වේ.

තවද වැඩබිම්තුල ඇති විවිධ නිරාවරණ නිසා ඇතිවන වෘත්තීය රෝග හඳුනාගෙන ඒවා නිවාරණය කිරීම සඳහා ආයතනය නොපසුබටව ක්‍රියා කරයි.

වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය නගා සිටුවීම සඳහා ආයතනය මගින් විවිධ පුහුණු පාඨමාලා ඔස්සේ මෙන්ම හරවත් දේශන පවත්වමින්ද සුරක්ෂිතතා නිලධාරීන් පුහුණු කිරීම මගින්ද වැඩබිමෙහි සිදුවන වෘත්තීය රෝග හා අනතුරු  අවම කරමින් වැඩි ඵලදායීතාවයක් රටට ලබාදීමට අප ආයතනය නිරතුරුවම කැප වී සිටියි.

ඉහත කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නායකත්වය, මග පෙන්වීම හා අනුග්‍රහය ලබාදුන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිඳුන්ට හා කම්කරු අමාත්‍යාංශ ලේකම් හා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ සභාපතිතුමා වන ඩබ්ලිව්.ජේ.එල්.යූ.විජයවීර මැතිඳුන්ට කෘතඥතාවය පළකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

එමෙන්ම මෙම කාර්ය සාධනය අත්කර ගැනීමෙහිලා කැපවීමෙන් හා සහයෝගයෙන් කටයුතු කළ මෙම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ සියළු කාර්යමණ්ඩලය ඇතුළු සියලු ආයතන ප්‍රධානීන්ට හා අප ආයතනයේ ප්‍රවර්ධනය සඳහා නොපසුබට දායකත්වයක් ලබාදුන් මාගේ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පුද කරමි.

**වෛද්‍ය එන්. සී. අමරසිංහ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

## 2012 වසරේ ළගා කරගත් ඉලක්ක හා ප්‍රගතීන්

**ඉලක්ක**

❖ සුරක්ෂිතතා නිලධාරීන් පුහුණු කිරීම.

- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීම.
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා 2ක් පැවැත්වීම.
- වැවිලි ක්ෂේත්‍රය සඳහා වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ උසස් පාඨමාලාවක් පැවැත්වීම.

❖ වැඩබිම් අධ්‍යයනය කිරීම මගින් පාරිසරික මිණුම් සේවාවන් ආයතන 90 ක් සඳහා ලබා දීම.

❖ වෘත්තිකයන්ගේ සෞඛ්‍ය පිළිබඳ ජීව විද්‍යාත්මක මිණුම් ලබා දීම. (ආයතන සඳහා වෛද්‍ය පරීක්ෂණ ලබාදීම.).

❖ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ දැණුම විවිධ ආයතන සඳහා ලබා දීම.

**ප්‍රගතීන්**

**<u>පුහුණු පාඨමාලා</u>**

- **වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව**

2012 වර්ෂයේ පෙබරවාරි මස වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව පවත්වන ලදී. මෙම පාඨමාලාවේ කාලසීමාව මාස 10 ක් වන අතර පාඨමාලාව හැදෑරීමට අප ආයතනයේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හදාරා තිබීම හෝ රජය විසින් පිළිගත් උපාධියක් තිබීම හෝ අවම වශයෙන් අවු.05 ක් ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්දක් තිබීම අනිවාර්ය වේ. 2012 වසරේ විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් විධායක නිළධාරීන් 24 ක් ලියාපදිංචි වී මෙම පාඨමාලාව හදාරණ ලදී. එතුලින් ලද පුහුණුව තුලින් වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් ලෙස විවිධ ක්ෂේත්‍රයන්ට මහඟු දායකත්වයක් ලබා දී ඇත.





- **වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම.**

2012 වර්ෂයේදී වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් දෙකක් පවත්වන ලදී. මෙම එක් පාඨමාලාවක කාලසීමාව සති 15 කි. සිසුන් 23 දෙනෙකු සාර්ථක අන්දමින් මෙම පාඨමාලා නිම කළ අතර මේ තුලින් මෙම පුහුණු නිළධාරීන්ගේ සේවා ස්ථාන තුළ වෘත්තීය අනතුරු අවම කර ගැනීමට පිටුවහලක් වී ඇත. මේ වනවිට වැඩි ප්‍රමාණයක් සුරක්ෂිතතා නිළධාරීන් ලෙස දැනට සේවයේ යෙදී සිටිති. වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳව උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට මෙම පාඨමාලාව හැදෑරිය හැක.





## ❖ වැවිලි ක්ෂේත්‍රය සඳහා වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ උසස් පාඨමාලාව

**2012** වර්ෂයේදී **(2012/06/06)** වැවිලි ක්ෂේත්‍රයේ විධායක නිළධාරීන් විසිදෙනෙකු ලියාපදිංචි වී දින **15** ක පුහුණු කාල සීමාවක් තුළදී මෙම පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී. මෙම පාඨමාලාව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික පුහුණුව ඇතුලත් වන පරිදි සංවිධානය කොට තිබුණි. මේ තුලින් රටතුල වැවිලි ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ වෘත්තීය සුරක්පිතතාව හා සෞඛ්‍ය වැඩිදියුණු වීමට පිටුවහලක් වී ඇති අතර වෘත්තීය ආරක්ෂාව තුළින් කර්මාන්තශාලා ඵලදායි වශයෙන් පුහුණලාභීන් යොදාගත් බව පුහුණුවෙන් පසු කරන ලද පසු විපරමේදී තහවුරු වන ලදී.











එමෙන්ම ක්ෂේත්‍රයේ උසස් වීම් ලබා ගැනීමටත්, වැවිලි ක්ෂේත්‍රයේ නියුතුවන්නන්ගේ වැඩ පරිසරය ක්‍රමානුකූලව සකස් කර ගැනීමටත් මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔවුන්ට අවස්ථාව ලැබී ඇත. ඒ වාගේම වෘත්තීය සුරක්පිතතා නිළධාරි යන තනතුර හඳුනා ගැනීම හේතුවෙන් ක්ෂේත්‍රය තුල වැඩි වටිනාකමක් එයට ලැබී ඇත. සේව්‍ය සේවක දෙපක්ෂය තුලම වැඩි ඵලදායීතාවයක් ගොඩ නගා ගැනීමට හැකි වීමද මෙතුලින් ලැබූ තවත් ප්‍රගතියකි. මෙම පාඨමාලාව හැදෑරුවන් සඳහා වෘත්තීය මාර්ග උපදේශන අත් පොතක් ලබා දීමටද මේ වන විට කටයුතු සලසා ඇත.

- **වැඩබිම් අධ්‍යයනය කිරීම මගින් පාරිසරික මිණුම් සේවාවන් ලබා දීම.**

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් දෛනික කාර්යයක් ලෙස විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන්හි කර්මාන්තශාලා 90 ක් සඳහා පාරිසරික මිනුම් සඳහා සේවාවන් සපයා ඇත. මෙම මිණුම් මගින් කර්මාන්තශාලා තුළ ශබ්දය, ආලෝකය, තාපය, රසායන ද්‍රව්‍ය ප්‍රමාණය මැන බැලීම සිදු කරන අතර එමගින් සිටින සේවකයින්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳ නිර්දේශ ලබාදීම සිදුකර ඇති අතර, අවට පරිසරයට වන බලපෑම්ද අවම කිරීමට කටයුතු කිරීම තුලින් අප පරිසරය සුරකීමට මනා පිටුවහලක් ලබා දී ඇත. ඒ තුළින් අදාළ ප්‍රමිතිවලට අනුකූලවන බවට දෙනුලබන සහතිකය නිසාවෙන් ජාත්‍යන්තර ඇණවුම් ලබාගැනීමටද අදාල ව්‍යවසායකයින්ට හැකි වී ඇත.



- **වෘත්තිකයන්ගේ සෞඛ්‍ය පිළිබඳ ජීව විද්‍යාත්මක මිණුම් ලබා දීම. (ආයතන සඳහා වෛද්‍ය පර්යේෂණ ලබාදීම)**

විවිධ ආයතන හා කර්මාන්තශාලා වල සේවයේ නියුතු ශ්‍රමිකයන්ගේ රැකියාවට සුදුසු බව සෞඛ්‍ය විද්‍යාත්මකව තීර්ණය කිරීම සඳහා ශ්‍රවණ තත්ත්වය, පෙනහළුවල ක්‍රියාකාරීත්වය හා රුධිර පරීක්ෂාව මෙන්ම අක්ෂි පරීක්ෂාවන්ද 2012 වර්ෂයේදී සිදු කෙරිනි. ඒ මගින් වැඩකරන සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ආරක්ෂා කිරීමට මනා පිටුවහලක් විය.





❖ **වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන සඳහා දැණුම ලබා දීම.**

ආයතන තුළ පවත්වනු ලබන අවශ්‍යතාවට අනුකූලව සැකසූ එක්දින පුහුණු වැඩසටහන් 10ක් සේවා ස්ථානයන්හි පවත්වන ලදී.





වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් කොළඹ වෛද්‍ය විද්‍යාලය, කැළණිය, පේරාදෙණිය වැනි විශ්වවිද්‍යාලයන්හි සිසුන්, පශ්චාත් උපාධි සඳහා හා විවිධ රාජ්‍ය ආයතන සඳහා දේශන, අවශ්‍යය තොරතුරු, උපදෙස් හා සේවාවන් මුදල් අයකිරීමකින් තොරව ලබා දී ඇත.

# 2012 වර්ෂයේ විශේෂ ක්‍රියාකාරකම්

- **වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳ පොදු ජනතාව සහ වෘත්තීය පුහුණුකරුවන් දැනුවත් කිරීම හා සෞඛ්‍ය සායන පැවැත්වීම-01**

2012 ජනවාරි මස සිට බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගීත්වයෙන් අප ආයතනය විසින් බස්නාහිර පළාතේ කලාප හත (07) තුළ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අපද්‍රව්‍ය හසුරුවන්නන් සඳහා වැඩමුළු හතක් (07)ක් පවත්වන ලදි. ඒ සඳහා අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්, සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් ඇතුළත්ව සේවකයන් 300 ක් සාර්ථක ලෙස පුහුණුව නිම කරන ලදි. තවද, මේ තුලින් බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණය සාර්ථක කර ගැනීමට වැදගත් සේවයක් වූවා සේම අපද්‍රව්‍ය හසුරුවන්නන්ගේ සහයෝගය, සෞඛ්‍ය දැනුම වර්ධනය වීම තුලින් එහි වැඩකරන සේවක මහතුන්ගේ සෞඛ්‍ය හා වෘත්තීය සුරක්ෂිතතාව මෙන්ම, ජනතාවගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාව ආරක්ෂා වීමටද මහගු පිටුවහලක් ලැබී ඇත.






මෙහිදී අපද්‍රව්‍ය කළමනාකරණ වෘත්තිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම වැඩමුළු වලට සමගාමීව සෞඛ්‍ය සායන පවත්වා නොමිලේ එම සේවකයින් හට රුධිර පරීක්ෂණ, ශ්‍රවන පරීක්ෂණ, අක්ෂි පරීක්ෂණ සිදුකර ගැනීමට අවස්ථාව ලබාදීම හා නොමිලේ ඇස් කණ්නාඩි ලබා දීම සිදුකරන ලදි. ඒ සමගම ඔවුන්ට අවශ්‍ය පුද්ගල ආරක්ෂණ උපකරණ ලබා දෙන ලදි.

- **වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ප්‍රතිලාභ පිළිබඳ පොදු ජනතාව සහ වෘත්තීය පුහුණුකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.**

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තවත් පියවරක් ලෙස 2012 මැයි මස සිට බස්නාහිර පළාතේ පළාත් පාලන 18 ක සේවය කරන අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් 4000ක් සඳහා වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් කිරීම කරන ලදි. ඒ තුළින් ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය හා ජීවන රටාවේ පැහැදිලි වෙනසක් ඇති කිරීමට හැකියාවක් ලැබුණි. එමගින් වර්තමානයේ උග්‍ර ප්‍රශ්ණයක් ලෙස සලකන කසල කළමනාකරණය තුළින් මුදල් ඉපැයීමටත් ඒවා මගින් විසිතුරු භාණ්ඩ නිපදවීම තුළින් එම සේවකයන්ට අමතර ආදායම් ඉපැයීමේ ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමක් අප ආයතනය විසින් සිදු කරන ලදී.







- **ශ්‍රී ලංකාව තුළ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ත්‍රෛපාර්ෂික සැපයුම්කරණ වැඩමුළු පැවැත්වීම.**

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ICTAD ආයතනය සමග ත්‍රෛපාර්ෂික සැපයුම්කරණ වැඩමුළු පැවැත්වීම.




- **ජාත්‍යන්තර කම්කරු සංවිධානය මූල්‍ය අනුග්‍රහය දැක් වූ GREEN JOBS ව්‍යාපෘතියේ දැනුම බෙදා ගැනීමේ වැඩමුළුවක් පැවැත්වීම.**

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ GREEN JOBS ව්‍යාපෘතියේ තවත් අදියරක් ලෙස ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය අනුග්‍රහයෙන් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව පැවැත්වූ වැඩමුළු වලින් ලබාගත් දැනුම බෙදාදීමේ වැඩසටහනක් රේණුකා හෝටලයේදී පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල නිළධාරීන් හා රාජ්‍ය ආයතනවල විධායක ශ්‍රේණියේ නිළධාරීන් රැසක් ද මේ සඳහා සහභාගි වන ලදී.






- **වෘත්තීය පුහුණු උපදේශකවරුන් සඳහා වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්බන්ධව සිංහල හා දමිළ මාධ්‍යයෙන් දින 03 බැගින් වැඩමුළු 2 ක් පැවැත්වීම.**

වෘත්තිය පුහුණු උපදේශකවරුන් සඳහා වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්බන්ධව සිංහල හා දමිළ මාධ්‍යයෙන් දින 03 ක වැඩමුළු දෙකක් කැනේඩියානු ලෝක විශ්ව විද්‍යාල සංගමයේ මූල්‍ය දායකත්වයෙන් සැප්තැම්බර් මස 18, 19, 20 හා 25, 26, 27 යන දිනයන්හි ඉතා සාර්ථක අන්දමින් පැවැත්වූ අතර ඒ සඳහා සිංහල මාධ්‍යයෙන් වෘත්තිය පුහුණුකරුවන් 20 දෙනෙකුද දමිළ මාධ්‍යයෙන් වෘත්තිය පුහුණුකරුවන් 20 දෙනෙකුද සහභාගී විය.








මෙම වැඩමුළු සඳහා උතුරු හා නැගෙනහිර පළාත් නියෝජනය කරමින් පුහුණුකරුවන්ගේ සහභාගීත්වය තිබීම මගින් වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳ මනා දැනුමක් හා අවබෝධයක් ලබා ගැනීමට හැකි වූවාසේම මෙතුලින් රටතුළ ජාතික සමගිය ගොඩනැගීමේ කාර්ය භාරයටද උරදීමක් ලබාදී ඇත. එම ලබාගත් පුහුණුව තුලින් ඔවුන් නැවත වෘත්තිය පුහුණුව ලබන ශිෂ්‍යයන් හට එම දැනුම බෙදාදීම තුලින් නවකයින් වශයෙන් වෘත්තියට එක්වන අය සඳහා තමන්ගේ වෘත්තීමය ආරක්ෂාව සහ අනාගත ඵලදායීතාවයට පිටුවහලක් වනු ඇත.

- **"වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය තුලින් හරිත ලොවක් කරා" යන තේමාව යටතේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය පැවැත්වීම.**

    - **2012/10/05 වන දින ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය වෙනුවෙන් මාධ්‍ය හමුවක් පැවැත්වීම.**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය වෙනුවෙන් වැඩකරන ජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය හමුවක් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.ඒ සඳහා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.ජේ.එල්.යු. විජයවීර මහතා, කම්කරු කොමසාරිස් ජනරාල් පර්ල් වීරසිංහ මහත්මිය කර්මාන්ත සුරක්ෂිතතා අංශ ප්‍රධානී සුජාතා විජයසුන්දර මහත්මිය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය එන්.සී. අමරසිංහ මහත්මිය මේ සඳහා සහභාගී වූහ. එහිදී වෘත්තීය අනතුරු අවම කර ගැනීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු අමාත්‍යාංශය දැනට ගෙන ඇති පියවරයන් සහ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් හා වෘත්තීය සුරක්ෂිතතා සතිය තුළදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් පිළිබඳව ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය කරුණු පැහැදිලි කිරීමක් කරන ලදී.

ඊට අමතරව ශ්‍රව්‍ය දෘෂ්‍ය විද්‍යුත් මාධ්‍ය තුලින් සජීවී වැඩසටහන් මෙන්ම පුවත් වාර්තා මගින් එම සතිය තුළ ජනතාව දැනුවත් කරන ලදී. ඒ සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වාධීන රූපවාහිනී සේවය, සිරස , ස්වර්ණවාහිනී මෙන්ම ලේක් හවුස් , විජය පුවත්පත යන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් පූර්ණ අනුග්‍රහය ලබාදී සහයෝගය දක්වන ලදී.






- **ෆින්ලේස් වැඩබිමෙහි සෞඛ්‍ය පිලිබඳව සේව්‍ය සේවකයන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය වෙනුවෙන් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ නිලධාරීන් සම්බන්ධ කරගෙන ෆින්ලේස් වැඩබිමෙහිදී සේව්‍ය සේවකයන් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් ඔක්තෝම්බර් 06 සෙනසුරාදා දින පෙ.ව. 8.30 සිට ප.ව 1.30 දක්වා පවත්වන ලදී.






- **ICTAD ආයතනය හා ඒකාබද්ධව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවකයන් හට වැඩමුළුවක් පැවැත්වීම.**

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ICTAD ආයතනය සමග වෘත්තීය අනතුරු හා රෝගාබාධ සම්බන්ධයෙන් වැඩකරන ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2012 ඔක්තෝම්බර් 08 දින කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මහතාගේ ප්‍රධානත්වයෙන් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. මෙහි මූලික අරමුණ වූයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ **"OSH in Zero"** තේමාවයි. වෘත්තීය අනතුරුවලට මුහුණපාන ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවකයන් හට ඇස් අනතුරු වළක්වා ගැනීම සම්බන්ධයෙන් වැඩසටහනක් හා අක්ෂි සායනයක් මෙහිදී පවත්වන ලදී. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අනතුරු වලට මුහුණපා ආබාධිත තත්වයට පත්වූ සේවකයන්ට පරිත්‍යාග ලබා දුන් අතර, තවද ආබාධිත තත්වයට පත්වූ සේවකයන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානයක් ශ්‍රම වාසනා අරමුදලේ අනුග්‍රහයෙන් සිදු කරන ලදී. මෙම වැඩසටහන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ ICTAD ආයතනය ඒකාබද්ධව සිදුකරන ලදී.





- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතියේ ප්‍රධාන සමුළුව**



ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතියේ ප්‍රධාන වැඩසටහන ලෙස සැලකූ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සේව්‍යයන් දැනුවත් කිරීම සඳහා වූ සමුළුව 2012 ඔක්තෝම්බර් මස 10 වන දින කොළඹ ගලධාරී හෝටලයේ දී ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ. ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පැවැත්වුණි. වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ හරවත් හා ඵලදායි දේශන රැසකින් සමන්විත වූ මෙම සමුළුව සඳහා ලංකාවේ පිළිගත් ආයතනවල විධායක නිලධාරීන් මානව සම්පත් කළමණාකරුවන් හා නිලධාරීන් රැසක් සහභාගී වුණි. මේ සඳහා සම්පත් දායකයින් ලෙස විනය පතාක් මහතා, ඩයන් ගෝමස් මහතා යන මහත්වරුන්ගේ දායකත්වය ලබාදෙන ලදී. එදින 2012 වසරේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව නිමකළ සිසුන් 13 දෙනෙකුට සහතික ප්‍රදානය කිරීමක් ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී. Brandix පුද්ගලික ආයතනය මේ සඳහා ප්‍රධාන අනුග්‍රහය දක්වන ලද අතර 3M පුද්ගලික ආයතනය හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සම අනුග්‍රහකත්වය දක්වමින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සමග අත්වැල් බැඳගෙන කටයුතු කරන ලදී.












- **වැවිලි ක්ෂේත්‍රයේ නියුතු වූවන් සඳහා සහතික ප්‍රධානෝත්සවය පැවැත්වීම.**

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ උසස් පාඨමාලාව සාර්ථකව නිම කළ වැවිලි ක්ෂේත්‍රයේ නියුතු සුපරීක්ෂකවරුන්, කළමනාකරුවන්, සුරක්ෂිතතා නිලධාරීන් සඳහා සහතික ප්‍රධානෝත්සවය 2012 ඔක්තෝම්බර් 12 වන දින ගාලුමුවදොර හෝටලයේදී ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මෙම පාඨමාලාව සඳහා කැනේඩියානු ලෝක විශ්ව විද්‍යාල සංගමයේ වැවිලි ප්‍රජා ව්‍යාපෘති දෙක හා එතිකල් ටී පාට්නර්ෂිප් යන ආයතනයන්හි ඒකාබද්ධ මූල්‍ය දායකත්වය යටතේ වැවිලි ක්ෂේත්‍රයේ නියුතු සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ඉහළ නැංවීමේ ප්‍රධාන පරමාර්ථය ඇතිව වතු සමාගම් පහකට අයත් වතු විස්සක තෝරාගත් නිලධාරීන් විසි දෙනෙකු සහභාගී වූ අතර,ඔවුන් සඳහා දින 15 ක පාඨමාලාවක් සාර්ථක අන්දමින් නිම කරන ලදී. මීට අමතරව මෙම වැඩසටහන යටතේ වැවිලි ක්ෂේත්‍රය සඳහා වෘත්තීය සෞඛ්‍ය සඳහා උපදේශන අත්පොතක්ද නිර්මාණය කරන ලදී.








- **Greater Colombo Waste Water Management Project**

මෙම ව්‍යාපෘතිය යටතේ කොළඹ නගර සභාවේ අපනල පද්ධතිවල සේවය කරන වැඩ සුපරීක්ෂකවරුන් හා තාක්ෂණික නිලධාරීන් හට වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීමේ දින 05 ක වැඩමුළුවක් දෙසැම්බර් 05, 11, 14, 17 හා 20 යන දිනයන්හිදී ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේදී පවත්වන ලදී. මේ සඳහා නිලධාරීන් පහලොස්දෙනෙකු සහභාගි විය.




මෙම ව්‍යාපෘතිය යටතේ කොළඹ නගර සභාවේ අපනල පද්ධති වල සේවය කරන සේවකයින් සඳහා වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව එක් දින වැඩමුළුවක් දෙසැම්බර් 10 වන දින ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේදී පවත් වන ලදී. මේ සඳහා කොළඹ නගර සභාවේ අපනල පද්ධතියේ සේවය කරන සේවකයන් 23 දෙනෙකු සහභාගී විය. මෙහිදී පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතය හා එහි වැදගත්කම, වෘත්තීමය රෝග, හදිසි අනතුරකදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ ඔවුන් දැනුවත් කරන ලදී. මෙතුළින් සේවකයන් හට වෘත්තීමය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳ දැනුම පෞද්ගලික ජීවිතයට කෙතරම් වැදගත්ද යන්න පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගැනීමට හැකිවිය.




**ජාතික ප්‍රමිත සංවර්ධනය**

IDRC ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ නැනෝ තාක්ෂණය සම්බන්ධව ඇති ක්‍රියාකාරකම් සඳහා රෙගුලාසි රාමුවක් දියුණු කිරීමට ISO 230585 හා ISO 130225 ප්‍රමිත ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග එක්ව කටයුතු කරගෙන යාම. ඒ සඳහා අවශ්‍ය කටයුතු මේ වනවිට දියත්වෙමින් පවතී.

SLAB ආයතනයේ සහයෝගය ඇතිව සෞඛ්‍ය සම්පන්න විද්‍යාගාර ක්‍රියාකාරකම් (GLP) සඳහා මාර්ගෝපදේශන වර්ධනය කිරීම.

- **වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යයනය සඳහා වූ පුස්තකාලය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය පරිශ්‍රයේ බිම් මහලේ වෘත්තීය සුරක්ෂිතතාවය සම්බන්ධව ප්‍රයෝජනවත් පොත්පත් රාශියක් පුස්තකාලය සතුවේ. පහත සඳහන් විෂයන් පිළිබඳ පොත්පත්, වාර සඟරා, පත්‍රිකා, වාර්තා, නිබන්ධන, පුනර්මුද්‍රණ, පුහුණු මොඩියුල, රසායනික ආරක්ෂණ දත්ත සටහන් පත්‍ර, දත්ත පාදක පුවත් ලිපි ආදිය සම්බන්ධව අධ්‍යයනය කරන සිසුන්ගේ පරිශීලනය සඳහා සතියේ දින වල විවෘතව ඇත.

වෘත්තීය සෞඛ්‍යය

කර්මාන්ත සෞඛ්‍යය

පාරිසරික සෞඛ්‍යය

මහජන සෞඛ්‍යය

වැඩ කිරීමට සුදුසු පරිසරය

කාර්මික ආරක්ෂාව

රසායනික ආරක්ෂාව

වෘත්තීය රෝග

කර්මාන්ත නීති සම්පාදනය

විෂ විද්‍යාව


වතුර සහ සනීපාරක්ෂාව

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය

| | නම | තනතුර | කාර්යාල ලිපිනය |
|---|---|---|---|
| 01. | ඩබ්.ජේ.එල්.යූ විජයවීර මහතා | ලේකම් | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය |
| 02. | පී. වීරසිංහ මහත්මිය | කම්කරු කොමසාරිස් ජනරාල් | කම්කරු ලේකම්, කම්කරු දෙපාර්තමේන්තුව |
| 03. | රවී පීරිස් මහතා | අධ්‍යක්ෂ ජනරාල් | හාම්පුතුන්ගේ සංගමය |
| 04. | ඩබ්.ජ්වී.පියදාස මහතා. | සභාපති | පොදු සේවක නිදහස් වෙළඳ සංගමය |
| 05. | ලෙස්ලි දේවේන්ද්‍ර මහතා | සභාපති | ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය |
| 06. | වෛද්‍ය. නර්මි වික්‍රමසිංහ | වෘත්තීය රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය | ආසිරි රෝහල, කිරුළ පාර, නාරාහේන්පිට |
| 07. | මහාචාර්ය. සුභාංගි හේරත් | සමාජවිද්‍යා අංශාධිපති | සමාජ විද්‍යා අධ්‍යයන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය |
| 08. | එච්.කේ. බාලචන්ද්‍ර මහතා | අධ්‍යක්ෂ ජනරාල් | ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය |
| 09. | ඩබ්.එල්.එස්.විජේසුන්දර මිය. | කම්කරු කොමසාරිස් | කාර්මික සුරක්ෂිතතා අංශය කම්කරු දෙපාර්තමේන්තුව |
| 10. | සී. සේනානායක මිය. | නියෝජ්‍ය අධ්‍යක්ෂ | ජාතික සැලසුම් සම්පාදන දෙපාර්තමේන්තුව |
| 11. | වෛද්‍ය ඒ. ජයලාල් | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රජා සෞඛ්‍ය සේවා අංශය, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය |
| 12. | එස්.ජ්.එස්. රුවිර විතාන | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | කාර්මික අංශය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය |
| 13. | වෛද්‍ය ඩී.බී.ටී. විජේරත්න | කෘෂි හා කෘෂි සංවර්ධන අධ්‍යක්ෂක | කෘෂිකාර්මික හා කෘෂි සංවර්ධන අමාත්‍යාංශය |
| 14. | වෛද්‍ය එන්.සී අමරසිංහ | අධ්‍යක්ෂ ජනරාල් | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය |

# මූල්‍ය විශ්ලේෂණය 2011-2012

| | 2011 | 2012 |
|---|---|---|
| වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පාඨමාලාව තුළින් ලද ආදායම | 1,194,127.00 | 1,881,785.93 |
| පාරිසරික මිණුම් තුළින් ලද ආදායම | 1,661,500.00 | 2,418,363.00 |
| වෙනත් ආයතන සමග ඇතිකරගත් සහයෝගිතා ගිවිසුම් තුළින් සපයනු ලැබූ සේවා සඳහා ලබාගත් ආදායම | 262,280.72 | 2,765,096.66 |
| නැනෝ තාක්ෂණය ව්‍යාපෘතිය තුළින් ලද ආදායම | 325,000.00 | 490,000.00 |
| වෛද්‍ය පරීක්ෂණ කටයුතු තුළින් ලද ආදායම | 269,100.00 | 350,176.00 |
| ගොඩනැගිලි කුලියට දීම තුළින් ලද ආදායම | 474,750.00 | 296,597.59 |
| වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය දිනයේදී ලද ආදායම | 490,610.40 | 252,819.83 |
| පොලී ආදායම(NIOSH සංවර්ධන අරමුදල) | | 719,390.41 |
| වෙනත් ආදායම් | 19,607.00 | 35,658.00 |
| එකතුව | 4,696,975.12 | 9,209,887.42 |



# මූල්‍ය ප්‍රකාශනය
## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**ශේෂ පත්‍රය 2012 දෙසැම්බර 31 වන දිනට**

| | |
|---|---|
| **ස්ථාවර වත්කම්** | රු. |
| ස්ථාවර වත්කම් | 11,925,028.67 |
| සමුච්චිත ක්ෂය | 3,424,811.35 |
| ශුද්ධ ස්ථාවර වත්කම් | 8,500,217.32 |
| ප්‍රාග්ධන වියදම් ප්‍රධාන කාර්යාලය මගින් | 1,171,423.33 |
| **ජංගම වත්කම්** | |
| වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ සංවර්ධන අරමුදල | 10,000,000.00 |
| උත්සව අත්තිකාරම් | 4,000.00 |
| උපචිත ලැබීම් | 719,390.91 |
| මුදල් තැම්පතු - මහජන බැංකුව | 3,472,695.31 |
| සුලු මුදල් (අත ඉතිරි මුදල්) | 10,000.00 |
| මුලු වත්කම්වල එකතුව | 23,877,726.87 |
| | |
| ආරම්භක සංචිත | 8,414,095.92 |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | (639,048.00) |
| රඳවාගත් ශුද්ධ වත්කම් වටිනාකම | 3,163,919.80 |
| වර්ෂය තුළ ඉපයූ ශුද්ධ ආදායම(31/12/2012) | 11,001,879.70 |
| මුළු සංචිත | 21,940,847.42 |
| **ජංගම වගකීම්** | |
| ණයහිමි සහ උපචිත වියදම් | 1,894,981.15 |
| ගෙවිය යුතු සේ.අ.අ. | 19,042.00 |
| ගෙවිය යුතු සේ.නි.අ. | 2,856.30 |
| ඉදිරි වර්ෂය සඳහා ලැබීම් | 20,000.00 |
| | 1,936,879.45 |
| මුලු එකතුව | 23,877,726.87 |

| සහතික කලේ | පරීක්ෂා කලේ | සකස් කලේ |
|---|---|---|
| ......................... | ......................... | ......................... |
| ඩබ්ලිව්.ජේ.එල්.යූ.විජයවීර | වෛද්‍ය එන්.සී. අමරසිංහ | පී.එම්.කේ.පෙරේරා |
| සභාපති | අධ්‍යක්ෂ ජනරාල් | ස. අ. (මුදල්) |
| ජා.වෘ.සු.සෞ.ආයතනය | ජා.වෘ.සු.සෞ.ආයතනය | ජා.වෘ.සු.සෞ.ආයතනය |

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය**
**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් ප්‍රකාශය**

| | |
|---|---|
| භාණ්ඩාගාර ලැබීම් | |
| 127-2-3-32201 | 5,148,455.21 |
| 127-2-3-31503 | 2,200,168.16 |
| වෘත්තිය සුරක්ෂිතතා පාඨමාලා වලින් ලද ආදායම | |
| සහතිකපත් පාඨමාලාව | 731,485.83 |
| ඩිප්ලෝමා පාඨමාලාව | 992,600.10 |
| හෙද පුහුණු පාඨමාලාව | - |
| කාර්මික පුහුණු පාඨමාලාව | 157,700.00 |
| පාරිසරික මිනුම් වලින් ලද ආදායම | 2,418,363.00 |
| අනෙකුත් ක්‍රියාකාරකම් වලින් ලද ආදායම | 2,765,096.66 |
| ව්‍යාපෘති මගින් ලද ආදායම | 490,000.00 |
| වෛද්‍ය පරීක්ෂණ තුළින් ලද ආදායම | 350,176.00 |
| දේශන ශාලා තුළින් ලද ආදායම | 296,597.59 |
| පොලී ආදායම් | 719,390.41 |
| ජා.වෘ.සු. සතියෙන් ලද ආදායම | 252,819.83 |
| අනෙකුත් | 35,658.00 |
| | 16,558,510.79 |
| ආයතන පරිපාලන වියදම් | 2,199,170.59 |
| කාර්යාල වියදම් | 3,028,581.41 |
| ගමන් වියදම් හා වාහන වියදම් | 239,628.99 |
| මූල්‍ය වියදම් | - |
| අනෙකුත් වියදම් | 89,250.10 |
| | 5,556,631.09 |
| **අතිරික්ත ආදායම** | **11,001,879.70** |

## ගිණුම්වලට අදාළ සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**1 . වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

1.1 වාර්තා කරන ආයතනය

ශ්‍රී ලංකාවේ කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ වන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 2005 අප්‍රේල් 28 වැනි දින ස්ථාපිත කරන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, නිසි සෞඛ්‍ය හා ආරක්ෂිත පියවර පිළිබඳ දැනුවත්භාවය සහ බැඳියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට කැපවී සිටියි. මෙම ආයතනය කොළඹ - 05, ජාවත්ත පාරේ අංක 97 දරන ස්ථානයේ පිහිටා තිබේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

යෝග්‍ය සෞඛ්‍ය සහ ආරක්ෂණ නීතිරීති පිළිබඳ දැනුවත්භාවය සහ බැඳියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කැපවී සිටියි. මෙම ක්‍රියාකාරකම්වලට යාවත්කාලීන කරනු ලැබූ තොරතුරු බෙදා හැරීම සහ උපදේශක හා උපදේශන සේවා ඇතුළත්වේ. මෙම ආයතනය මගින් සිදුකරනු ලබන පුහුණු කිරීම් තුළින් ප්‍රතිලාභ ලැබිය හැකි සේව්‍යයන්, සේවකයන් හා වෙනත් සියලුම ගණයන්හි ජනතාව දැනුවත් කිරීම සහ පුහුණු කිරීම මෙන්ම වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යයන, සමීක්ෂණ සහ පර්යේෂණ සඳහා ආයතනය සහයෝගය දක්වයි.

1.3 පිළියෙළ කිරීමේ පදනම

(අ) අනුකූලතා ප්‍රකාශය

මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශලවලට ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) විසින් පනවා ඇති කුඩා ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ( SLASSE) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළකොට තිබේ.

(ආ) මිනුම් පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළකොට තිබේ. මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදුකර නැත.

(ඇ) සක්‍රිය සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ආයතනික ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

## 2. දේපළ, පිරියත හා උපකරණ

i. හඳුනාගැනීම හා මැනීම

භාණ්ඩ විෂයයන් දේපළ, පිරියත හා උපකරණ මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම සහ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිවීම්වලින් සිදුවන අලාභ පදනම් කරගෙනය.

යන්ත්‍ර සූත්‍රයකට සහ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක පිරිවැයට ඇතුළත් වන්නේ එය මිලදී ගත් වටිනාකම සහ එය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා එකී වත්කම ක්‍රියාකරවීමට සෘජුව දරන ලද පිරිවැයයි.

කිසියම් දේපළකට, යන්ත්‍ර සූත්‍රයකට හෝ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම් වෙන වෙනම ගිණුම්ගතකොට තිබේ නම්, උපාංගය පිළිබඳව ඉදිරියට ගෙන යන කපාහළ වියදම්වලට ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. ඉන්ඉක්බිතිව කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ දේපළ, පිරියත හා උපකරණවලට අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ එමගින් වැඩිවන්නේ නම් පමණි. සෙසු වියදම් දරනු ලැබූ පරිද්දෙන් වේ.

ii. ක්ෂයවීම්

වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලයට අනුව සෘජු රේඛා පදනමක් මත ආදායම් ප්‍රකාශය තුළ ක්ෂයවීම් හඳුනා ගැනේ.

ප්‍රවර්තන හා සංසන්දනාත්මක කාල සීමා සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජ්‍ය ආයුකාලයන් පහත දැක්වේ.

| | අවුරුදු |
|---|---|
| යන්ත්‍ර කට්ටල හා යන්ත්‍රසූත්‍ර | 10 |
| පරිගණක උපකරණ | 5 |
| ලීබඩු සහ සවිකිරීම් | 10 |
| ශබ්ද පද්ධති අයිතම | 5 |
| වෛද්‍ය උපකරණ | 10 |
| වෙනත් වත්කම් | 10 |

මිලදී ගත් අවුරුද්ද තුළ ක්ෂයවීමක් සිදු නොකෙරෙන අතර අපහරණය කරන වර්ෂයේදී ඊට සම්පූර්ණ ක්ෂයවීමක් ඇතුළත් වේ.

iii. ස්ථාවර වත්කම්

ආයතනය ආරම්භ කිරීමේදී කම්කරු අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුව විසින් වරින්වර ඊට මාරු කර එවන ලද සමහර වත්කම් ඇතුළත් වේ. 2012 වර්ෂයේදී වත්කම් සමහරක් ඉහත වර්ෂයේ ශේෂ පත්‍රයේ සීරුමාරු කිරීම් යටතේ ප්‍රාග්ධනීකරණයකොට ක්ෂයවීම් සිදුකරන ලදී.

iv. නව වෛද්‍ය උපකරණ මිලදී ගැනීම

ජාතික පදනම් ආයතනය විසින් නැනෝ තාක්ෂණික වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු. 16,50,000ක් මාරුකොට තිබුණු අතර 2012.12.31 වැනි දිනට එය මිලදී නොගත් හෙයින් එම මුදල ශේෂ පත්‍රයේ උපචිත වශයෙන් දක්වා ඇත.

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No } එල්එස්/ඕ/එන්අයිඕඑස්එච්/ එෆ්ඒ/2012 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2013 ඔක්තෝබර් 09 දින |

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය,

**ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2013 ජූලි 23 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
දුරකථනය
ෆැක්ස් අංකය
ඉලෙක්ට්‍රොනික් තැපැල්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකාරීත්ව තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) 1971 අංක 38 දරණ මුදල් පනත** | |
| (i) 10(5) වගන්තිය | යම් වර්ෂයක ශුද්ධ අතිරික්ත ආදායමින්, ඉතිරි මුදල් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු වුවත්, ප්‍රවර්ථන වර්ෂයේ රු.11,001,880 ක ශුද්ධ අතිරික්ත ආදායමින් ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. |
| (ii) 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් දෙන ලද අනුමැතියකින් තොරව ප්‍රවර්ථන වර්ෂයේ රු.මිලියන 10 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 103 හා 104 | ආයතනයට අයත් ලැප්ටොප් පරිගණකයක් 2012 අප්‍රේල් 23 දින සිට අස්ථානගත වී ඇති අතර, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව මූලික පරීක්ෂණයක් හෝ සම්පූර්ණ පරීක්ෂණයක් කොට නොතිබුණි. |
| (ii) මු.රෙ. 756 | 2009 වර්ෂයේ සිට භාණ්ඩ හා පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

(ඇ) ආයතන සංග්‍රහය

| | |
|---|---|
| IX පරිච්ඡේදයේ 2.2 ඡේදය | ප්‍රවර්තන වර්ෂය තුළ දේශන පවත්වා රජයේ නිලධාරීන් වන දේශකයින්ට ගෙවූ රු.96,750 ක මුදලින් සියයට 10 ක් එනම් රු.9,675 ක් රාජ්‍ය භාගය ලෙස ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කළ ගිණුම අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ජාතික වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵල රු.11,001,880 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව පෙර වර්ෂය සඳහා අතිරික්තය රු.4,721,416 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙන් පෙර වර්ෂයට වඩා රු.6,280,464 ක ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම්වල සියයට 112 ක වැඩි වීමක් මෙයට හේතු වී තිබුණි. ආදායම් වැඩි වීම කෙරේ ප්‍රධාන වශයෙන් බලපා තිබුණේ රජයේ දායකය සියයට 137 කින් වැඩි වීමක් හා විවිධ පාඨමාලා ආදායම සියයට 96 කින් වැඩි වීම වේ.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

ක්‍රියාකාරී සැලැස්ම හා කාර්ය සාධන වාර්තා නොමැති බැවින් ඉටුකරන ලද කටයුතුවල භෞතික කාර්ය සාධනය සම්බන්ධයෙන් ඇගයීමක් කළ නොහැකි විය.

### 4.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

4.2.1 (අ) 2009 හා 2010 වර්ෂවල පුද්ගලික ආයතනවලින් ලද රු.267,500 ක ආදායම් සඳහා මුදල් භාර ගැනීමේ කුවිතාන්සි 08 ක් අදාළ ආයතන වෙත නිකුත් කර තිබුණේ ඊට වසර දෙකකට පමණ පසු 2011 වර්ෂයේ දී බව අනාවරණය විය.

(ආ) රු.267,500ක වටිනාකමකට අයත් චෙක්පත් 08 ක් මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාවේ බැංකු ජංගම ගිණුමේ උපලබ්ධි නොවූ චෙක්පත් ලෙස දක්වා තිබුණත් මෙම චෙක්පත් වෙනත් බැංකු ජංගම ගිණුමකට බැර කර තිබුණි. මෙය පසුගිය වර්ෂයේ විගණන වාර්තාවේ ද නිරීක්ෂණය කර ඇතත්, ඒ සම්බන්ධව 2013 අගෝස්තු දක්වා කටයුතු කර නොතිබුණි.

**4.2.2** විශ්‍රාමික පර්යේෂණ සහකාර නිලධාරියෙකුට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්එස්/ඊ3/39/7/047/1 දරණ ලිපිය පාදක කරගෙන ගෙවීම් කිරීමට අමාත්‍යාංශය ලේකම් කටයුතු කර තිබූ අතර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උක්ත ලිපියෙන් ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දී තිබුණේ පර්යේෂණ සහකරුවන් සඳහා නොව, දේශකයන්ට දේශක ගාස්තු ගෙවීම සඳහා වේ. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය වැරදි ලෙස අර්ථකථනය කරගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.171,000 ක දේශන ගාස්තු උක්ත පර්යේෂණ සහකාර නිලධාරියාට ගෙවා තිබුණි.

මෙම නිලධාරියාට දිවයිනේ ඕනෑම ප්‍රදේශයකට ගියත් ගෙවනු ලබන්නේ පැයකට රු.500 බැගින් උපරිම පැය 03 ක් පමණක් සඳහා බවත් පළපුරුදු පුහුණු කිරීමේ නිලධාරියෙකු බවත් අධ්‍යක්ෂ ජනරාල් විගණනයට දැනුම් දී ඇත.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත නොකළ පර්යේෂණ නිලධාරි තනතුරක නිලධාරිනියක් සේවයේ යොදවා ගෙන තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2013 අප්‍රේල් 24 දිනදීය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම මාසයකුත් දින 24 ක් ප්‍රමාද කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව වර්ෂ තුනකට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

ආයතනය ස්ථාපිත කළ දින සිටම අභ්‍යන්තර විගණන අංශයක් ඇති කර නොතිබුණු අතර, රේඛීය අමාත්‍යාංශය වන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය මගින් ද අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5.5 විගණන කමිටුව

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රවර්තන වර්ෂය සඳහා විගණන කමිටු පිහිටුවා විගණන හා කළමනාකරණ රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5.6 ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරණ ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රවර්තන වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) සැලසුම් කිරීම.
(ආ) අභ්‍යන්තර විගණනය.
(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය.
(ඈ) අයවැය ලේඛනමය පාලනය.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.